# ආර්ථික හා සමාජ පිරිවැය

## බලශක්තිය

ජල විදුලිය බල උත්පාදනය වැඩි වීමත් සමඟම 1988 වර්ෂයේදී බලශක්ති අංශය සැළකිය යුතු අන්දමින් දියුණුවට පත් විය. ලෝක වෙළෙඳපොලේ තෙල් මිළ පහත වැටීමද බලශක්ති අංශයේ මෙම යහපත් තත්ත්වය කෙරෙහි බලපෑවේය. ජලාශවල ජල මට්ටම වැඩි වීම නිසා ජල විදුලිය බලය මගින් දිවයිනේ බලශක්ති අවශ්‍යතාවයෙන් විශාලතම කොටසක් සපුරාලීමටත්, එමගින් තාප බල උත්පාදනය වෙත රැඳී සිටීම අඩු කර ගැනීමටත් ලංකා විදුලිබල මණ්ඩලයට (ලං.වි.ම.) හැකි විය. මෙම තත්ත්වයන් ඛනිජ තෙල් ආනයන වියදම අඩු වීම කෙරෙහි බලපෑවේය. කෙසේ වෙතත්, වර්ෂයේ අවසාන කාර්තුව තුළදී සම්ප්‍රේෂණ මාර්ග සහ ට්‍රාන්ස්පෝමර්වලට සිදු වූ අලාභහානි හේතුකොටගෙන බලශක්ති අංශයට අනපේක්ෂිත ගැටළුවකට මුහුණ පෑමට සිදු විය. 1988 වර්ෂයේ අවසාන සති කිහිපයේදී රටේ ආරක්ෂක තත්ත්වය යහපත් අතට පත් වීම නිසා මෙම තත්ත්වය සැළකිය යුතු අන්දමින් දියුණුවට පත් විය.

ඉකුත් වර්ෂවලදී මෙන්ම 1988 වර්ෂයේදීත් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම බලශක්ති මූලාශ්‍ර වූ දර, කෘෂිකාර්මික අප ද්‍රව්‍ය හා ශාඛ සහ සත්ව අප ද්‍රව්‍ය ශ්‍රී ලංකාවේ මුළු බලශක්තියෙන් සියයට 70 ක් පමණ සැපයේ යැයි ගණන් බලා ඇත. මෙම ප්‍රමාණය 1988 වර්ෂයේදී තෙල් ටොන් දශ ලක්ෂ 4.6 කට සමාන යයි ඇස්තමේන්තු කර ඇත. ඉතිරි ප්‍රමාණයෙහි ඛනිජ තෙල්, විදුලිය බලය ද්‍රව ඛනිජ වායුව සහ ගල් අඟුරු සුළු ප්‍රමාණයක්ද අඩංගු වේ.

1988 අප්‍රේල් මාසයේදී නිලඹේ ජල විදුලිය බල ව්‍යාපෘතියත් (එකක් මෙ.වො. 1.6 බැගින් යුත් ටර්බයින් යන්ත්‍ර දෙකක්), දෙසැම්බර් මාසයේදී කොත්මලේ ජල විදුලිය බල ව්‍යාපෘතියත් (මෙ.වො. 67) ආරම්භ කිරීම සමඟම ජල විදුලිය බල ධාරිතාවය මෙ. වො. 938.45 දක්වා සියයට 8 කින් වැඩි විය. 1988 වර්ෂය අවසානය වනවිට මෙ. වො. 270 ක් වූ තාප බල ධාරිතාවයද එකතුවූ කල මුළු විදුලිය බල ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 1,208.45 දක්වා ඉහළ නැඟුණි. විමසුමට ලක් වන වර්ෂය තුළදී ප්‍රතිසංස්කරණ කටයුතු නිසා කැළණිතිස්ස බලාගාරය වසා තැබීමට සිදු විය.

1988 වර්ෂයේදී ජල විදුලිය බල ධාරිතාවය වැඩි වීමත්, බල උත්පාදනය හා බෙදා හැරීමේ කටයුතු වැඩි දියුණු වීමත් සමඟම බෙදා හැරීමේදී හා උත්පාදනය කිරීමේදී සිදුවන පාඩුව සියයට 16 හි පවත්වා ගැනීමට ලං.වි.ම. ට හැකි විය. ජල විදුලිය බලය වැඩි වීම හේතුකොටගෙන තාපබල උත්පාදනය සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන උපයෝජනය අඩු වූවා පමණක්නොව වැඩි වන බලශක්ති ඉල්ලුම සපුරාලීමටද ඉඩ කඩ සැළසුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1987 වර්ෂයේදී සියයට 39 ක්ව තිබූ වාණිජ බලශක්තියෙහි ජල විදුලියට අදාළ කොටස 1988 වර්ෂයේදී සියයට 44 දක්වා වැඩි විය.

කිලෝ වොට් (කි. වො.) පැය දශ ලක්ෂ 2,800 ක් වූ 1988 වර්ෂයේ ලං.වි.ම. විසින් උත්පාදනය කරන ලද මුළු බලශක්ති ප්‍රමාණය ඉකුත් වර්ෂයේ උත්පාදිත ප්‍රමාණයට වඩා සියයට 3 කින් වැඩි විය. ජලාශවල ජල මට්ටම ඉහළ යාම නිසා ජල විදුලිය උත්පාදන යන්ත්‍ර උපරිම ධාරිතාවයෙන් ක්‍රියා කරවීමට හැකි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1987 වර්ෂයේදී සියයට 80 ක්ව තිබූ ජල විදුලිය බලයෙහි සාපේක්ෂ කොටස 1988 වර්ෂයේදී සියයට 93 දක්වා ඉහළ නැඟුණි. මේ අනුව කි.වො.පැය දශ ලක්ෂ 530 ක්ව පැවැති තාප බල උත්පාදනය කි. වො. පැය දශ ලක්ෂ 202 දක්වා සියයට 62 කින් පමණ සැළකිය යුතු ලෙස අඩු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස විදුලිය බල උත්පාදන පිරිවැයද පහත වැටුණි.

කි. වො. පැය දශ ලක්ෂ 2,253 ක් වූ 1987 වර්ෂයේ මුළු විදුලිය බල අලෙවිය සමඟ සසඳන විට 1988 වර්ෂයේ විදුලිය අලෙවිය කි. වො. පැය දශ ලක්ෂ 2,341 දක්වා සියයට 4 කින් ඉහළ නැඟුණි. වාණිජ කටයුතු සඳහා විදුලිය අලෙවිය කි. වො. පැය දශ ලක්ෂ 442 දක්වා සියයට

5 කින්ද, කාර්මික සහ ගෘහස්ථ අංශ සඳහා විදුලිය අලෙවිය පිළිවෙලින් කි. වො. පැය දශ ලක්ෂ 898 සහ කි. වො. පැය දශ ලක්ෂ 397 දක්වා සියයට 4 බැගින්ද වැඩි විය. පළාත් පාලන ආයතනවලට විදුලිය අලෙවි කිරීමද කි. වො. පැය දශ ලක්ෂ 590 දක්වා සියයට 3 කින් වැඩි විය. වර්ෂයේ අවසාන කාර්තුව තුළදී දිවයිනේ අභ්‍යන්තරික නොසන්සුන්තා උග්‍ර නොවූයේ නම් මෙම වර්ධන අනුපාතිකය මෙයට වඩා සැළකිය යුතු අන්දමින් ඉහළ යෑමට ඉඩ තිබුණි.

1988 වර්ෂයේ ආරම්භයේ සිට විදුලිය බල ගාස්තු ප්‍රතිශෝධනය කරන ලද අතර ඒකක 100 ක් ඉක්මවා විදුලිය පරිභෝජනය කිරීමේදී සියයට 20 ක ඉන්ධන ගැලපුම් ගාස්තුවක්ද පනවන ලදී. විදුලිය ගාස්තු වැඩි කිරීම සියයට 15–20 අතර ප්‍රමාණයක පැවතුණි. මේ පිළිබඳ විස්තර 1.20 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**1 . 20 සංඛ්‍යා සටහන**

**සංශෝධිත විදුලිබල ගාස්තු***

| අංශය | පැරණි ගාස්තු රු. ශත | සංශෝධිත ගාස්තු රු. ශත |
|---|---|---|
| ගෘහස්ථ | | |
| ඒකක – 0 – 10 .. | 0·50 | 0·55 |
| 11 – 100 .. | 0·90 | 1·05 |
| 101 – 450 .. | 1·80 | 2·00 |
| 450 > .. | 2·25 | 2·50 |
| කාර්මික | | |
| ඒකකයක ගාස්තුව – I කාණ්ඩය .. | 1·55 | 1·75 |
| – II කාණ්ඩය .. | 1·45 | 1·60 |
| – III කාණ්ඩය .. | 1·25 | 1·50 |
| පොදු කාර්ය | | |
| ඒකකයක ගාස්තුව – I කාණ්ඩය .. | 1·75 | 2·00 |
| – II කාණ්ඩය .. | 1·60 | 1·90 |
| – III කාණ්ඩය .. | 1·50 | 1·80 |
| හෝටල් | | |
| ඒකකයක ගාස්තුව – I කාණ්ඩය .. | 1·70 | 1·95 |
| – II කාණ්ඩය .. | 1·60 | 1·85 |
| – III කාණ්ඩය .. | 1·50 | 1·75 |
| .. | | |
| ආගමික ස්ථාන සහ පුණ්‍යායතන | | |
| ඒකක 0 – 150 .. | 0·50 | 0·60 |
| 150 > .. | 0·50 | 2·00 |

මූලය : ලංකා විදුලිබල මණ්ඩලය.

* ඒකක සියයකට වඩා වැඩියෙන් පාරිභෝජනය කෙරෙන ප්‍රමාණය සඳහා ඉන්ධන ගැලපුම් ගාස්තු අය කෙරේ.

සටහන : I කාණ්ඩය – වෝල්ට 400/230 බලයකින් සපයන්නාවූ සහ ගිවිස ගත් අවශ්‍යතාවය දහසු වෝල්ට ඇම්පියර් 50 ට අඩු.

II කාණ්ඩය – වෝල්ට 400/230 බලයකින් සපයන්නා වූ සහ ගිවිස ගත් අවශ්‍යතාවය දහසු වෝල්ට ඇම්පියර් 50 ට සමාන හෝ වැඩි.

III කාණ්ඩය – වෝල්ට 11,000 බලයකින් විදුලිය සැපයීම.

දිවයිනේ අභ්‍යන්තරික නොසන්සුන්තා නිසා, ආදායම අඩු වීම අතින් මෙන්ම, ප්‍රාග්ධන පොදු කාර්ය පද්ධතියට අලාභහානි සිදු වීම අතින්ද බලශක්ති අංශයට අහිතකර ප්‍රතිඵල ගෙන දුනි. මෙම හේතුවෙන් 1988 වර්ෂයේදී ලං.වි.ම. ට සිදුවූ අලාභය රුපියල් දශ ලක්ෂ 333 පමණ වේ යැයි ගණන් බලා ඇත. මෙයින් රුපියල් දශ ලක්ෂ 83 ක් ප්‍රාග්ධන පාඩුද, රුපියල් දශ ලක්ෂ 250 ක්

ආදායම් පාඩුද වෙයි. මෙම පාඩු එහි වාණිජ ඵලදායිතාවයට දැඩි ලෙස හානි කර විය. කෙසේ වෙතත්, 1988 වර්ෂයේ අවසාන සති කිහිපයේදී රටේ ආරක්ෂක තත්ත්වය යහපත් අතට හැරීම නිසා ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් වී බලශක්ති සැපයුමද දියුණු තත්ත්වයට පත් විය.

**1 . 21 සංඛ්‍යා සටහන**

**බලශක්ති අංශයේ මූලික ලක්ෂණ**
**1987 – 1988**

| ශීර්ෂය | | ඒකක | 1987 | 1986 ට වඩා ප්‍රතිශත වෙනස | 1988 (අ) | 1987 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|---|
| 1. බණිජ තෙල් නිෂ්පාදන | | | | | | |
| 1·1 අපනයන | .. | රු. ද. ල. | 2,592·2 | 9·9 | 2,265·4 | – 12·6 |
| එම | .. | විගැහි ද. ල. | 68·0 | – 5·2 | 53·0 | – 22·1 |
| 1·2 ආනයන | .. | රු. ද. ල. | 8,715·8 | 38·5 | 7,839·2 | – 10·1 |
| එම | .. | විගැහි ද. ල. | 228·8 | 19·6 | 183·3 | – 19·9 |
| 1·3 ආනයනය කළ ප්‍රමාණය | | | | | | |
| 1·3·1 බොර තෙල් | .. | මෙ. ටො. | 1,778,853 | 8·6 | 1,894,135 | 6·5 |
| 1·3·2 පිරිපහදු නිෂ්පාදන | .. | මෙ. ටො. | 251,786 | 70·7 | 143,079 | – 43·2 |
| 1·3·3 අනෙකුත් නිෂ්පාදන | | මෙ. ටො. | 25,738 | 3·6 | 26,688 | 3·7 |
| 1·4 බොර තෙල් බැරලයක සාමාන්‍ය මිළ | .. | රුපියල් | 543·29 | 19·6 | 486·85 | – 10·4 |
| එම | .. | එ. ජ. ඩොලර් | 18·45 | 13·5 | 15·38 | – 16·6 |
| 1·5 දේශීය අලෙවිය | | | | | | |
| 1·5·1 පෙට්‍රල් | .. | මෙ. ටො. | 140,402 | 7·5 | 154,507 | 10·0 |
| 1·5·2 සුදු ඩීසල් | .. | ,, | 497,303 | 1·7 | 495,295 | – 0·4 |
| 1·5·3 බැර ඩීසල් | .. | ,, | 131,802 | ** | 48,890 | – 62·9 |
| 1·5·4 සුපිරි ඩීසල් | .. | ,, | 20,558 | 29·5 | 19,334 | – 6·0 |
| 1·5·5 භූමි තෙල් | .. | ,, | 155,575 | 0·9 | 157,164 | 1·0 |
| 1·5·6 දැවි තෙල් | .. | ,, | 161,668 | 24·9 | 165,503 | 2·4 |
| 1·6 දේශීය මිළ | .. | | | | | |
| 1·6·1 පෙට්‍රල් | .. | ලීටරයක් රුපියල් | 13·50 | — | 13·50 | — |
| 1·6·2 සුදු ඩීසල් | .. | ,, | 8·13 | — | 8·13 | — |
| 1·6·3 බැර ඩීසල් | .. | ,, | 7·83 | — | 7·83 | — |
| 1·6·4 සුපිරි ඩීසල් | .. | ,, | 9·28 | — | 9·28 | — |
| 1·6·5 භූමි තෙල් | .. | ,, | 6·58 | — | 6·58 | — |
| 1·6·6 දැවි තෙල් | .. | | | | | |
| 500 | .. | ,, | 4·22 | — | 4·22 | — |
| 800 | .. | ,, | 3·87 | — | 3·87 | — |
| 1000 | .. | ,, | 3·72 | — | 3·72 | — |
| 1·6·7 තාර | .. | කිලෝ ග්‍රෑමයක් රුපියල් | 7·22 | — | 7·22 | — |
| 2. විදුලිය බලය | | | | | | |
| 2·1 ස්ථාපිත ධාරිතාවය | .. | මෙගවොට් | 1,138·25 | 12·7 | 1,208·45 | 6·2 |
| 2·1·1 ජල බලය | .. | ,, | 868·25 | 16·3 | 938·45 | 8·1 |
| 2·1·2 තාප බලය | .. | ,, | 270·00 | 2·3 | 270·00 | — |
| 2·2 ජනනය කළ ඒකක | .. | කි. වො. පැ. ද. ල. | 2,707·6 | 2·1 | 2,799·5 | 3·4 |
| 2·2·1 ජල බලය | .. | ,, | 2,177·5 | – 17 7 | 2,597·7 | 19·3 |
| 2·2·2 තාප බලය | .. | ,, | 530·1 | *** | 201·8 | – 61·9 |
| 2·3 මුළු අලෙවිය | .. | ,, | 2,252·8 | 0·9 | 2,341·2 | 3·9 |
| 2·3·1 ගෘහස්ථ | .. | ,, | 382·2 | 3·5 | 397·0 | 3·9 |
| 2·3·2 කාර්මික | .. | ,, | 865·9 | – 6·4 | 897·8 | 3·7 |
| 2·3·3 වාණිජ | .. | ,, | 418·9 | 9·8 | 441·5 | 5·4 |
| 2·3·4 පළාත් පාලන ආයතන | | ,, | 570·6 | 5·0 | 590·1 | 3·4 |
| 2·3·5 වීථි ආලෝක කිරීම | | ,, | 15·2 | 16·0 | 14·8 | – 2·6 |

(අ) තාවකාලික
** පෙර වර්ෂයට වඩා 6 ගුණයකින් වැඩිය.
*** පෙර වර්ෂයට වඩා 82 ගුණයකින් වැඩිය.

මූලයන් : ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය.

1988 වර්ෂයේදී ලෝක වෙළෙඳපොලේ බොර තෙල් මිළ අඩු වීමත්, තාප බල උත්පාදනය පහත වැටීමේ හේතුවෙන් බැර ඩීසල් පරිභෝජනය අඩු වීමත් යන දෙකරුණ හේතුකොටගෙන ඛනිජ තෙල් ආනයනය සඳහා වැය වූ විදේශීය විනිමය ප්‍රමාණය සැළකිය යුතු අන්දමින් අඩු විය. 1987 වර්ෂයේදී මුළු ආනයන වියදමෙන් සියයට 14 ක් වූ ඛණිජ තෙල් ආනයන වියදම 1988 වර්ෂයේදී සියයට 11 දක්වා අඩු විය. මුළු ඛනිජ තෙල් ආනයන වියදම විගැහි වටිනාකමට අනුව සියයට 20 කින්ද (මුළු වියදම විගැහි දශ ලක්ෂ 183), රුපියල් අගය අනුව සියයට 10 කින්ද (මුළු වියදම රුපියල් දශ ලක්ෂ 7,839) අඩු වූ නමුත් බොර තෙල් ආනයන පරිමාව මෙට්‍රික් ටොන් 1,894,135 දක්වා සියයට 6 කින්ද, අනෙකුත් ඛනිජ තෙල් නිෂ්පාදන පරිමාව මෙට්‍රික් ටොන් 26,688 දක්වා සියයට 4 කින්ද ඉහළ නැගුණි.

දේශීය වෙළෙඳපොලෙහි ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර විකුණුම් මිළ නොවෙනස්ව පැවතුණි. මේ අතර ලෝක වෙළෙඳපොලේ සාමාන්‍ය බොර තෙල් බැරලයක මිළ ඇ.එ.ජ. ඩොලර් 15.38 (රුපියල් 487) දක්වා සියයට 17 කින් පමණ සැළකිය යුතු අන්දමින් අඩු විය.

1988 වර්ෂයේදී තාප බල උත්පාදනය අඩු වීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය වෙළෙඳ-පොලෙහි බැර ඩීසල් ඉල්ලුම සැළකිය යුතු අන්දමින් පහත වැටුණි. ඒ අනුව බැර ඩීසල් අලෙවියද මෙට්‍රික් ටොන් 48,890 දක්වා සියයට 63 කින් අඩු විය. මේ පරිද්දෙන්ම සුපිරි ඩීසල් අලෙවියෙහි සියයට 6 ක අඩු වීමක් වාර්තා විය. දේශීය වෙළෙඳපොලෙහි අනෙකුත් සියළුම ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය සාමාන්‍ය ප්‍රමාණයකින් වැඩි විය. පෙට්‍රල්, ද්‍රව් තෙල් සහ භූමි-තෙල් අලෙවිය පිළිවෙලින් සියයට 10 කින්, සියයට 2 කින් සහ සියයට 1 කින් වැඩි විය.

**ගමනාගමනය**

1988 වර්ෂය තුළදී ගමනා ගමන අංශය විශාල පසුබෑස්මකට ලක්විය. දිවයිනේ අභ්‍යන්-තරික නොසන්සුන්තා නිසා ශ්‍රී ලංකා ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩල (ශ්‍රී ලං. ප්‍රා. ග. ම.) වල ක්‍රියාකාරිත්වයට බෙහෙවින් බාධා පැමිණි අතර, වර්ෂයේ අවසාන කාර්තුවේදී මේ තත්ත්වය විශේෂයෙන් කැපී පෙනුනි. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ධාවන කටයුතුද සැළකිය යුතු අන්දමින් කපා හරින ලද අතර, උතුරු සහ නැගෙනහිර පලාත්වල පැවති අවිනිශ්චිත තත්ත්වය හේතු කොට ගෙන එම පලාත්වල දුම්රිය සේවා මුළුමනින් අත්හිටුවන ලදී. මේ අතර වාහන සහ අමතර කොටස් ආනයනය කිරීමේ වියදම ඉහළ යාම නිසා ධාවන කටයුතු පුළුල් කිරීමට පෞද්ගලික අංශයටද නොහැකි විය. එමෙන්ම අඛණ්ඩව පැවති අභ්‍යන්තරික නොසන්සුන්තා මගින්ද පෞද්ගලික අංශයේ ගමනා ගමන සේවාවලට හානි සිදු විය.

වර්ෂය තුළදී ශ්‍රී ලං. ප්‍රා. ග. ම. ධාවන කටයුතු සැළකිය යුතු ලෙස පහත වැටුණි. ධාවන කිලෝ මීටර් ප්‍රමාණය දශ ලක්ෂ 332 දක්වා සියයට 10 කින් අඩු විය. ඉකුත් වර්ෂයේදී වාර්තා වූ සියයට 1 ක අඩුවීම සමඟ මෙය සැසඳිය හැකිය. මේ අනුව 1987 වර්ෂයේදී 4,676 ක් වූ ශ්‍රී ලං. ප්‍රා. ග. ම. විසින් දිනකට ධාවනය කරවනු ලැබූ බස් රථ සංඛ්‍යාව 1988 වර්ෂයේදී 4,421 ක් බවට පත්විය. දිවයිනේ අභ්‍යන්තරික නොසන්සුන්තා මෙම පහත වැටීමට විශාල වශයෙන් හේතු විය. උතුරු පලාතේ හැර අන් සියළු පලාත්වල ධාවන කටයුතුවල අඩු වීමක් දිස්විය. තවද දකුණ, බස්නාහිර, උතුරු මැද, වයඹ සහ ඌව යන ප්‍රදේශවල නියමිත ධාවන සේවා අභ්‍යන්තරික නොසන්සුන්තා නිසා විශාල අන්දමින් පසුබෑස්මකට ලක්විය. මෙම ප්‍රාදේශික වලට ධාවනය කළහැකි වූයේ සිය නියමිත සේවාවලින් සියයට 61 පමණ සාමාන්‍ය ප්‍රමාණයකි.

ශ්‍රී ලං. ප්‍රා. ග. ම. සතු රථ ඇණිය අබලන් තත්ත්වයක පැවතීමද ධාවන කටයුතු අඩුවීම කෙරෙහි බලපෑවේය. රථ ඇණියෙන් සියයට 54 කට ආසන්න ප්‍රමාණයක් ධාවනයට නුසුදුසු තත්ත්වයක පැවතුණි. මුහුණ පෑමට සිදුවූ තවත් ප්‍රශ්නයක් වූයේ දිවයිනේ පැවති අභ්‍යන්තරික අරගල හේතුකොට ගෙන රථ ඇණියට හානි සිදුවීමයි. අළුත් බස් රථ කිහිපයක්ද ඇතුළු බස් රථ 609 ක් මුළුමනින් විනාශයට පත්වී හෝ අලාභහානිවලට ලක්වී හෝ තිබුණි. මෙහි ප්‍රතිඵලය වශයෙන් ශ්‍රී ලං. ප්‍රා. ග. ම. වලට රුපියල් දශ ලක්ෂ 63 ක පමණ ප්‍රාග්ධන අලාභයක් දැරීමට සිදු විය.

මෙම වර්ෂය තුළ ශ්‍රී ලං. ප්‍රා. ග. ම. වල ප්‍රධාන පරමාර්ථය වූයේ පවත්නා සේවා ප්‍රශස්ත අන්දමින් ක්‍රියාත්මක කරවීමත්, රථ ඇණිය වැඩි කිරීමත් මගින් වඩාත් විශ්වාසදායී සේවාවක් මහජනයා වෙත ලබාදීමයි. පාඩු ගෙන දෙන ගමන් වාර අඩු කිරීමෙන්ද, ඉල්ලුම් විචලනය නිරන්තර අධීක්ෂණයට භාජනය කිරීමෙන්ද, ශ්‍රී ලං. ප්‍රා. ග. ම. සිය සේවා වරින් වර සංශෝධනය කරන ලදී. මේ අතර රථ ඇණිය වැඩිකර ගැනීමටද, ශ්‍රී ලං. ප්‍රා. ග. ම. විසින් තවදුරටත් පියවර ගනු ලැබීය. මේ අනුව හානියට පත්වූ සහ අබලන් වූ බස් රථ වෙනුවට නව බස් රථ 320 ක් රථ ඇණියට අළුතින් එක්කරන ලදී.

මෙම පියවර මගින් වර්ෂයේ මුල් මාස නමය තුළදී වඩාත් දියුණු සේවාවක් මහජනයාට ලබා දීමට ශ්‍රී ලං. ප්‍රා. ග. ම. වලට හැකි විය. මෙම කාලපරිච්ඡේදය තුළදී මඟී කිලෝ මීටර් ප්‍රමාණය ඉකුත් වර්ෂයේ සම කාලපරිච්ඡේදයේ පැවති ප්‍රමාණයට වඩා සියයට 4 කින් වැඩි විය. එහෙත් වර්ෂයේ අවසාන කාර්තුවේදී දිවයිනේ අභ්‍යන්තරික නොසන්සුන්තා සීඝ්‍ර ලෙස පැතිරයාමත් සමඟ මෙම ප්‍රවනතාවය මුළුමනින්ම වෙනස් අතකට හැරුණි. මේ අනුව වර්ෂ අවසානයේදී මඟී කිලෝ මීටර් ප්‍රමාණය දශ ලක්ෂ 15,413 දක්වා සියයට 4 කින් අඩු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1988 වර්ෂයේ ශ්‍රී ලං. ප්‍රා. ග. ම. ආදායම රුපියල් දශ ලක්ෂ 2,502 දක්වා සියයට 2 කින් පහත වැටුණි. මේ අතර 1988 වර්ෂය තුළදී ශ්‍රී ලං. ප්‍රා. ග. ම. 6 ක විශාල පාඩු වාර්තා විය. දිවයිනේ අභ්‍යන්තරික නොසන්සුන්තා හේතුකොට ගෙන ශ්‍රී. ලං. ප්‍රා. ග. ම. වලට දැරීමට සිදුවූ ඇස්තමේන්තුගත අලාභය රුපියල් දශ ලක්ෂ 220 ක් පමණ වේ.

1988 වර්ෂය තුළදී ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කටයුතු තවදුරටත් පහත වැටුණි. ධාවන කිලෝ මීටර් ප්‍රමාණයෙහි දශ ලක්ෂ 7.2 දක්වා සියයට 12 ක අඩු වීමක් වාර්තා විය. 1987 වර්ෂයේ දක්නට ලැබුණු සියයට 3 ක වැඩිවීම සමඟ මෙය සැසඳිය හැකිය. උතුරු සහ නැගෙනහිර දුම්රිය මාර්ගවල නියමිත ධාවන සේවා අත්හිටුවීමත්, අනෙකුත් දුම්රිය මාර්ගයන්හි සේවාවලට නිරන්තරයෙන් එල්ල වූ බාධකත්, මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් බලපෑවේය. වර්ෂයේ මුල් මාස නමයේදී දුම්රිය සේවයට සිය නියමිත සේවාවලින් ධාවනය කළහැකි වූයේ සියයට 75 ක ප්‍රමාණයකි. වර්ෂයේ අවසාන මාස දෙක තුළදී මෙම ප්‍රමාණය සියයට 25 දක්වා සීමා විය. මේ තත්ත්වය යටතේ මඟී කිලෝ මීටර් ප්‍රමාණය දශ ලක්ෂ 1,786 දක්වා සියයට 13 කින් අඩු වූ අතර, සියයට 5 ක් වූ ඉකුත් වර්ෂයේ අඩුවීම සමඟ මෙය සැසඳීමට පුළුවන. මෙලෙසම භාණ්ඩ ප්‍රවාහන කටයුතුවල අඩුවීම නිසා බඩු ටොන් කිලෝ මීටර් ප්‍රමාණයද සියයට 10 කින් අඩු විය. මෙලෙස මඟී සහ භාණ්ඩ කිලෝ මීටර් ප්‍රමාණ අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1988 වර්ෂයේ දුම්රිය සේවයේ ආදායම රුපියල් දශ ලක්ෂ 437 දක්වා සියයට 10 කින් අඩු විය. රුපියල් දශ ලක්ෂ 916 ක් වූ මුළු වියදම අනුව බලන විට 1988 වර්ෂයේ දුම්රිය සේවයේ ධාවන පාඩුව රුපියල් දශ ලක්ෂ 479 ක් විය. 1987 වර්ෂයේ ධාවන පාඩුව වූ රුපියල් දශ ලක්ෂ 348 සමඟ මෙය සැසඳිය හැකිය.

දිවයිනේ අභ්‍යන්තරික නොසන්සුන්තා හේතුකොට ගෙන වර්ෂය තුළදී දුම්රිය මාර්ග පද්ධතියට බරපතල අලාභහානි සිදු විය. දුම්රිය ස්ථාන හතරක්, දුම්රිය එන්ජින් දෙකක් සහ මඟී දුම්රිය හතරක් විනාශයට පත්වූ අතර, දුම්රිය හතරක පීලි පැනීම් සිදු විය.

මෙවැනි පසුබෑසීම් මධ්‍යයේ වුවද සිය ප්‍රාග්ධන තොගය වැඩිකර ගැනීම සඳහා දුම්රිය සේවය විසින් පියවර කිහිපයක්ම ගනු ලැබීය. වර්ෂය තුළදී දුම්රිය බහලුම් තට්ටු 25 ක්, දුම්රිය ඇන්ජින් 20 ක් සහ බඩු ගැල් රථ 133 ක් රුමේනියාවෙන් මිළදී ගැනීමට කටයුතු කරනු ලැබිණි. මේ අතර කොන්ක්‍රීට් සිල්පර කඳන් තැනීමේ යන්ත්‍රයක්ද සවි කිරීමට පියවර ගනු ලැබිණි.

පෞද්ගලික අංශයේ මඟී ප්‍රවාහන සේවා කටයුතු 1988 වර්ෂයේදී තවදුරටත් අඩු විය. පෞද්-ගලික මඟී බස් රථ ගමනා ගමන අමාත්‍යාංශය විසින් 1988 වර්ෂය තුළදී බස් ධාවකයන් වෙත අළුතින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 1,854 දක්වා සියයට 18 කින් අඩු විය. මෝටර්

රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි වාර්තාවලින්ද පෙනී යන්නේ පෞද්ගලික බස් රථ නව ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව වර්ෂය තුළදී සැළකිය යුතු අන්දමින් අඩුවී ඇති බවයි. 1987 වර්ෂයේ නව ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව (1,151) සමග සසඳන විට 1988 වර්ෂයේ ලියාපදිංචි කරන ලද සංඛ්‍යාව 863 ක් පමණකි. බස් රථ සහ අමතර කොටස් ආනයනය කිරීමේ වියදම වැඩි වීමත්, මඟී ප්‍රවාහන ව්‍යාපාරවල ලාභදායිත්වය අඩු වීමත් මෙම තත්ත්වයට බොහෝ දුරට බලපෑවේය.

### 1 . 22 සංඛ්‍යා සටහන

### ගමනාගමන අංශයේ මූලික ලක්ෂණ 1987 – 1988

| ශීර්ෂය | ඒකකය | 1987 | 1986 ට වඩා ප්‍රතිශත වෙනස | 1988* | 1987 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. මෝටර් රථ නව ලියාපදිංචි කිරීම් .. | සංඛ්‍යාව | | | | |
| 1·1 ශ්‍රී. ලං. ග. ම. බස් රථ .. | ,, | 85 | – 66·5 | 245 | 188·2 |
| 1·2 පෞද්ගලික බස් රථ .. | ,, | 1,151 | – 35·4 | 863 | – 25·0 |
| 1·3 පෞද්ගලික මෝටර් රථ .. | ,, | 7,695 | 5·5 | 8,031 | 4·4 |
| 1·4 ද්විත්ව කාර්ය වාහන .. | ,, | 3,234 | – 16·9 | 3,002 | – 7·2 |
| 1·5 මෝටර් බයිසිකල් .. | ,, | 29,041 | 9·2 | 27,837 | – 4·1 |
| 1·6 භාණ්ඩ ප්‍රවාහන වාහන .. | ,, | 2,901 | – 13·4 | 2,504 | – 13·7 |
| 1·7 ඉඩම් වාහන .. | ,, | 2,727 | – 28·0 | 2,342 | – 14·1 |
| 1·8 වෙනත් .. | ,, | 50 | 194·1 | 1 | – 98·0 |
| 2. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය (ශ්‍රී.ලං.ග.ම.) | | | | | |
| 2·1 ධාවන කිලෝ මීටර් .. | දශ ලක්ෂ | 371·2 | – 1·3 | 332·4 | – 10·5 |
| 2·2 මඟී කිලෝ මීටර් .. | ,, | 15,974·0 | 5·4 | 15,413·0 | – 3·5 |
| 2·3 මුළු ආදයම .. | රු. දශ ලක්ෂ | 2,560·6 | 9·2 | 2,502·2 | – 2·3 |
| 2·4 මුළු වියදම .. | ,, | 2,640·2 | 0·8 | ලැ.නො. | — |
| 2·5 අතිරික්තය (+)/හිඟය (–) .. | ,, | – 79·6 | – 71·1 | ලැ.නො. | — |
| 3. ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී.ල.දු.සේ.) | | | | | |
| 3·1 ධාවන කිලෝ මීටර් .. | දශ ලක්ෂ | 8·2 | 3·8 | 7·2 | – 12·2 |
| 3·2 මඟී කිලෝ මීටර් .. | ,, | 2,058·5 | 4·4 | 1,785·7 | – 13·3 |
| 3·3 බඩු ටොන් කිලෝ මීටර් .. | ,, | 195·0 | – 4·2 | 176·4 | – 9·5 |
| 3·4 මුළු ආදයම .. | රු. දශ ලක්ෂ | 487·0 | 1·0 | 437·1 | – 10·2 |
| 3·5 මුළු වියදම .. | ,, | 834·9 | 8·3 | 916·0 | 9·7 |
| 3·6 අතිරික්තය (+)/හිඟය (–) .. | ,, | – 347·8 | 20·3 | – 478·9 | 37·7 |

* තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය;
ශ්‍රී ලංකා දුම්රිය සේවය;
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව.

කෙසේ වෙතත් මඟීන් හට වැඩි සුව පහසුවක් ලැබෙන අළුත් බස් රථ මිළදී ගෙන එමඟින් රථ ඇණිය තරමක් දුරට ශක්තිමත් කිරීමට හැකි විය. මේ අතර 1988 වර්ෂයේදී වාර්ෂිකව රථවාහන ලියාපදිංචිය අළුත් කිරීම් ප්‍රමාණය 4,661 දක්වා තුනෙන් එකකින් පමණ අඩු විය. පෞද්ගලික අංශය සතු බස් රථවල අබලන් ස්වභාවය පිළිබඳව මෙයින් පැහැදිළි වේ.

**නිවාස ඉදි කිරීම්**

1988 වර්ෂයේදී නිවාස සංවර්ධනයෙහි මූලික අවධානය යොමු වූයේ නිවාස දශ ලක්ෂයේ වැඩපිළිවෙල කෙරෙහිය. පවත්නා නිවාස වැඩි දියුණු කිරීම, දුප්පත් ජනතාවගේ නිවාසවල තත්ත්වය නඟා සිටුවීම සහ නව නිවාස ඉදි කිරීම සඳහා ණය සහ දීමනා ලබා දීමෙන් පවුල් දශ ලක්ෂයකට සහන සැළසීම නිවාස දශ ලක්ෂයේ වැඩපිළිවෙලෙහි ඉලක්කය විය. රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙන්ම සහභාගිත්වය ලැබුණු මෙම වැඩපිළිවෙලෙහි තේමාව වූයේ රජයේ අවම මැදිහත් වීමත්, නිවාස ඉදි කරන්නන්ගේ උපරිම සහභාගිත්වයත්ය.

නිවාස දශ ලක්ෂයේ වැඩපිළිවෙල දීප ව්‍යාප්ත වැඩපිළිවෙලක් වූ අතර එහි ක්‍රියාකාරිත්වය ග්‍රාමීය නිවාස උප වැඩපිළිවෙල, නාගරික නිවාස උප වැඩපිළිවෙල, වතුකරයේ නිවාස උප වැඩපිළිවෙල, මහවැලි සහ ප්‍රධාන ජනාවාස නිවාස උප වැඩපිළිවෙල සහ පෞද්ගලික අංශයේ නිවාස උප වැඩපිළිවෙල යටතේ සිදු විය. 1984 සිට වර්ෂ 6 ක කාලසීමාවක් තුළ ක්‍රියාත්මක වීමට නියමිත මෙම වැඩපිළිවෙල මගින් පවුල් විශාල සංඛ්‍යාවකට සහන සැළසීමට අපේක්ෂිතය.

නිවාස ණය දෙන ආයතනවලට මුහුණ පෑමට සිදු වූ මූල්‍ය දුෂ්කරතා සහ වර්ෂයේ අවසාන කාර්තුවේදී දිවයින තුළ පැවැති කලබල උග්‍ර වීම හේතුකොටගෙන ඉදි කරනු ලැබූ නිවාස සංඛ්‍යාව අනුව 1988 වර්ෂය තුළදී නිවාස දශ ලක්ෂයේ වැඩපිළිවෙලෙහි කටයුතුවල සුළු දියුණුවක් දක්නට ලැබුණි. මෙම මූල්‍යමය සම්බාධක තරමක් දුරට සමහන් වූයේ 1988 වර්ෂයේදී හඳුන්වා දෙන ලද 'දශ ලක්ෂ 100 සෙවන සරණ වැඩපිළිවෙල' සහ 1986 වර්ෂයේ සිට පැවැති 'සෙවන නිවාස ණය යෝජනා ක්‍රමය' නිසාය. දශ ලක්ෂ 100 සෙවන සරන නිවාස වැඩපිළිවෙල යටතේ දිළිඳු පවුල්වල නිවාස තත්ත්වය නගා සිටුවීම සඳහා පළාත් සභා ප්‍රදේශ සඳහා එක් පවුලකට උපරිම වශයෙන් රු. 5,000 බැගින්ද, නගර සභා ප්‍රදේශවල එක් පවුලකට රු. 7,000 බැගින්ද, මහ නගර සභා ප්‍රදේශවල එක් පවුලකට රු. 10,000 බැගින්ද ලබා දෙන ලදී.

ග්‍රාමීය නිවාස උපයෝජනා ක්‍රමය, නාගරික නිවාස උපයෝජනා ක්‍රමය, වතුකරයේ නිවාස උප යෝජනා ක්‍රමය, මහවැලි සහ ප්‍රධාන ජනාවාස නිවාස උපයෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලද්දේ රාජ්‍ය අංශය විසිනි. මේ අතරින් ග්‍රාමීය සහ නාගරික නිවාස උපයෝජනා ක්‍රම සඳහා සකසුරුවම් සහ සමුපකාර ණය දෙන සමිති මගින්ද, ග්‍රාමෝදය මණ්ඩල මගින්ද නිවාස ණය ලබා දෙන ලදී. සෙවන අරමුදල මගින්ද මෙම වැඩපිළිවෙලට ආධාර ලැබුණි. මේ අතර 1988 සැප්තැම්බර් මස 1 වැනි දින සිට ග්‍රාමීය සහ නාගරික නිවාස උප යෝජනා ක්‍රම යටතේ නිවාස ණය ලබන ආහාර මුද්දරලාභීන් ණය ආපසු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිණි. මෙම ගෙවීම් සෙවන අරමුදල මගින් පියවනු ලැබේ.

නිවාස ණය ලබා ගත් පවුල් සංඛ්‍යාව අනුව නියමිත ඉලක්කය ඉක්මවූ නමුත් නිම කරන ලද නිවාස සංඛ්‍යාව සළකන විට 1988 වර්ෂයේදී ග්‍රාමීය නිවාස උපයෝජනා ක්‍රමයෙහි පසුබෑස්මක් දක්නට ලැබේ. ග්‍රාමීය නිවාස උපයෝජනා ක්‍රමය යටතේ එක් පුද්ගලයකුට උපරිම වශයෙන් රු. 7,000 බැගින් පවුල් 32,000 ක් සඳහා ණය ලබා දීමට සැළසුම් කර තිබුණ අතර 1988 වර්ෂය තුළදී ණය ලබා ගත් මුළු පවුල් සංඛ්‍යාව 40,112 ක් විය. 1988 වර්ෂය තුළදී ඉදි කරන ලද නිවාස සංඛ්‍යාව 33,393 ක් වූ අතර 1987 වර්ෂයේ සංඛ්‍යාව වූ 45,245 සමඟ මෙය සැසඳිය හැකිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1987 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 222 ක් වූ මෙම යෝජනා ක්‍රමයේ මුළු වියදම 1988 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 192 දක්වා අඩු විය. දිවයිනේ හට ගත් අභ්‍යන්තරික නොසන්සුන්තා නිසා වර්ෂයේ අවසාන කාර්තුව තුළදී " ගම් උදාව විශේෂ වැඩසටහන " ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මෙම පහත් වර්ධනය කෙරෙහි බලපෑවේය.

ඉඩම් හා සේවා වැඩි දියුණු කිරීම සහ මුඩුක්කු හා පැල්පත් නගා සිටුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් යොමු වූ නාගරික නිවාස උප යෝජනා ක්‍රමය 1988 වර්ෂයේදී වඩාත් හොඳින් ක්‍රියාත්මක විය. මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීමට බලාපොරොත්තුවූ පවුල් සංඛ්‍යාව 10,070 ක් වුවද, ක්‍රියාත්මක වීමේදී නාගරික ප්‍රදේශවල පවුල් 18,485 කට ණය ලබා දීමට හැකි විය. මෙයට අමතරව පොදු කාර්ය පහසුකම් නගා සිටුවීම පිණිස ණය මුදල් 4,025 ක් ලබා දෙන ලදී. වර්ෂය තුළ සපයන ලද මුළු ණය දීම් අතුරින් නිවාස ඒකක 6,509 ක් තනා නිම කර තිබුණි. 1987 වර්ෂයේ අදාළ සංඛ්‍යාව වූ නිවාස ඒකක 7,778 සමඟ මෙය සැසඳීමට පුළුවන. නිවාස සහ පොදු කාර්ය පහසුකම් සඳහා දෙන ලද ණය යටතේ 1987 වර්ෂය තුළ රුපියල් දශ ලක්ෂ 77 ක්ද, 1988 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 105 ක්ද ලබා දෙන ලදී.

## 1 . 23 සංඛ්‍යා සටහන

## නිවාස දශ ලක්ෂයේ වැඩ සටහන යටතේ රාජ්‍ය අංශයේ නිවාස වැඩපිළිවෙලෙහි ක්‍රියාකාරිත්වය (1984 – 1988)

| යෝජනා ක්‍රමය | වර්ෂය | නිවාස ඉලක්කය (පවුල් සංඛ්‍යාව) | ණය ලබා ගත් පවුල් ගණන | | නිමකළ ඒකක ගණන | | වියදම (රුපියල් දශ ලක්ෂ) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | නිවාස ඉදි කිරීම් | පොදු කාර්ය කටයුතු | නිවාස ඉදි කිරීම් | පොදු කාර්ය පහසුකම් (පවුල් සංඛ්‍යාව) | සැළසුම් කළ | නියම |
| ග්‍රාමීය නිවාස උපයෝජනා ක්‍රමය (අ) .. | 1984 | 39,984 | 43,213 | — | 16,092 | — | 190·0 | 184·8 |
| | 1985 | 40,679 | 43,977 | — | 41,135 | — | 255·3 | 231·1 |
| | 1986 | 55,856 | 64,194 | — | 39,793 | — | 270·9 | 276·3 |
| | 1987 | 36,700 | 42,969 | — | 45,245 | — | 215·0 | 222·5 |
| | 1988* | 32,000 | 40,112 | — | 33,393 | — | — | 192·4 |
| නාගරික නිවාස උපයෝජනා ක්‍රමය (ආ) .. | 1985 | — | 7,584 | 14,788 | 2,314 | 14,788 | 150·3 | 38·5(ඇ) |
| | 1986 | 12,792 | 10,419 | 6,539 | 6,751 | 6,539 | 123·0 | 72·4(ඇ) |
| | 1987 | 10,828 | 7,334 | 7,013 | 7,839 | 7,013 | 115·3 | 76·7(ඇ) |
| | 1988* | 10,070 | 18,485 | 4,025 | 6,847 | 4,025 | — | 105·2(ඇ) |

මූලය : ජාතික නිවාස සංවර්ධන අධිකාරිය.

* තාවකාලිකයි.

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, සෙවන නිවාස වැඩපිළිවෙල, මහවැලි නිවාස වැඩපිළිවෙල සහ යොවුන් නිවහන වැඩපිළිවෙල යටතේ අනුමත කරන ලද නිවාස ණය මෙහි ඇතුළත් වේ.

(ආ) 'දශ ලක්ෂ 100 සෙවන සරණ නිවාස වැඩපිළිවෙල' යටතේ සෙවන අරමුදල විසින්ද නිවාස ණය දෙනු ලැබේ.

(ඇ) පොදු කාර්යය සහ පොදු පහසුකම් සඳහා වූ වියදම් මෙහි ඇතුළත් නොවේ.

මධ්‍ය කාලීන ආයෝජන වැඩපිළිවෙල සහ නෝර්වීජියානු–ඕලන්ද යෝජනා ක්‍රමය යටතේ ආධාර ලබන වතුකරයේ නිවාස උප වැඩපිළිවෙල මෙම වර්ෂය තුළදීත් ක්‍රියාත්මක විය. ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජනවසම) සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් ක්‍රියාත්මක වන මෙම යෝජනා ක්‍රම යටතේ 1988 වර්ෂයේ මුල් මාස නමය තුළ සැළකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබුණි. දිවයිනෙහි අභ්‍යන්තරික නොසන්සුන්තා උග්‍ර අතට පත් වීම නිසා වර්ෂයෙහි ඉතිරි කාල පරිච්ඡේදයේදී මෙම තත්ත්වය වෙනස් අතට හැරුණි. කම්කරු නිවාස 521 ක්, කාර්ය මණ්ඩල නිල නිවාස 79 ක්, නිවාස වැඩි දියුණු කිරීම් 1,173 ක්, සෞඛ්‍ය සහ ළමාරක්ෂන මධ්‍යස්ථාන 19 ක්ද 1988 වර්ෂය තුළදී ජනවසම විසින් ඉදි කරන ලදී. මෙලෙසම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින්ද වතු කම්කරුවන් සඳහා නිවාස 28 ක්ද, ජේලි කාමර 471 ක්ද, සෞඛ්‍ය සහ ළමා මධ්‍යස්ථාන 82 ක්ද 1988 වර්ෂය තුළදී ඉදි කරන ලදී. මෙයට අමතරව නිවාස 1,011 කට වැසිකිළි සහ ජල පහසුකම්ද ලබා දී ඇත.

1988 වර්ෂයේදී මහවැලි සහ ප්‍රධාන ජනාවාස නිවාස යෝජනා උප වැඩපිළිවෙල යටතේ එච්, බී, සී සහ ජී කලාපවල නිවාස 3,837 ක් සඳහා උළු සහ දැව සපයනු ලැබීය. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින්ද ප්‍රධාන ජනාවාස නිවාස යෝජනා ක්‍රමවල නිවාස ඉදි කිරීම සඳහා ණය සැපයීම සිදු කරන ලද හෙයින් මහවැලි සහ ප්‍රධාන ජනාවාස නිවාස යෝජනා ක්‍රමවලට පදිංචි කරුවන්ගේ පැමිණීම වැඩි විය. මෙම වැඩපිළිවෙල යටතේ 1988 වර්ෂය අවසානය වනවිට පවුල් 75,273 කට සහන සැලසුනි.

1988 වර්ෂය සඳහා සකස් කළ තාවකාලික දත්තවලට අනුව රාජ්‍ය අංශයේ නිවාස වැඩ පිළිවෙලෙහි මුළු වියදම රුපියල් දශ ලක්ෂ 483 ක් විය. 1987 වර්ෂයේ මුළු වියදම වූ රුපියල් දශ ලක්ෂ 515 සමඟ මෙය සැසඳීමට පුළුවන. 1988 වර්ෂයේ මුළු වියදමින් රුපියල් දශ ලක්ෂ 298 ක් ග්‍රාමීය සහ නාගරික නිවාස උපයෝජනා ක්‍රමය සඳහා මෙම වර්ෂය තුළදී වැය කරන ලදී.

1988 වර්ෂය තුළදී පෞද්ගලික අංශයේ නිවාස උප යෝජනා ක්‍රමය සැළකිය යුතු ප්‍රගතියක් පෙන්වීය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, රෙඩ්බානා සහ අන්තර් ජාතික සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජ්‍යායතනය (USAID) නිවාස ඉදි කරන පුද්ගලයන් සහ දේපල සංවර්ධකයන්ට නිවාස අරමුදල් සපයනු ලබන ප්‍රධානතම මූලාශ්‍ර ලෙස තවදුරටත් ක්‍රියාත්මක විය. පෞද්ගලික අංශය නිවාස ඉදි කිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ වාණිජ බැංකු වලින් ණය ලබා ගන්නා ලදී. ලංකා බැංකුව සහ මහජන බැංකුව මේ අතර ප්‍රධාන ස්ථානයක් ගනී. රාජ්‍ය අංශයේ නිවාස උපයෝජනා ක්‍රමය යටතේ මහ නගර සභා ප්‍රදේශවලට අයත් නිවාස ඉදි කිරීම් කටයුතුවල ප්‍රධාන උපනතී හඳුනාගත හැක්කේ කොළඹ මහ නගර සභාව විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැළසුම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු පදනම් කර ගැනීමෙනි. 1988 වර්ෂයේදී කොළඹ මහ නගර සභාව විසින් නේවාසික ගොඩනැගිලි සඳහා අයදුම්පත් 531 ක්ද, 1987 වර්ෂයේදී 596 ක්ද අනුමත කරන ලදී. ගොඩනැගිලි සැළසුම් පිළිබඳ සංසන්දනාත්මක සංඛ්‍යා තොරතුරු 1.24 සංඛ්‍යා සටහනෙහි දක්වේ.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නිවාස ඉදි කරනු ලබන පුද්ගලයන් සහ දේපල සංවර්ධකයන් හට නිවාස ණය සපයනු ලබන ප්‍රධානතම මූලාශ්‍රය ලෙස තවදුරටත් ක්‍රියාත්මක විය. 1988 වර්ෂය තුළදී නිවාස තැනීම සඳහා මුදා හරින ලද මුළු ණය මුදල රුපියල් දශ ලක්ෂ 542 කි. රුපියල් දශ ලක්ෂ 629 ක් වූ ඉකුත් වර්ෂයේ මුළු ණය මුදල සමඟ මෙය සැසඳිය හැකිය. ණය මුදලේ අඩු වීමට බොහෝදුරට බලපෑවේ නිවාස ණය ආපසු අය කර ගැනීමේ සීඝ්‍රතාවය අඩු වීමයි. 1988 වර්ෂයේ නිවාස ණය සඳහා අය කරන ලද පොළිය සියයට 2 සිට සියයට 20 දක්වා පැවතුණි.

## 1.24 සංඛ්‍යා සටහන

### කොළඹ මහ නගර සභාව විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම් 1987 – 1988 (අ)

| ශීර්ෂය | | 1987 | 1986 ට වඩා ප්‍රතිශත වෙනස | 1988 | 1987 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1. නව නේවාසික නිවාස | .. | 596 | 45·4 | 531 | – 10·9 |
| 1·1 නිවාස | .. | 246 | 9·8 | 205 | – 16·7 |
| 1·2 තට්ටු නිවාස | .. | 350 | 88·2 | 326 | – 6·8 |
| 2. වාණිජ ගොඩනැගිලි | .. | 65 | – 20·7 | 53 | – 18·5 |
| 3. කර්මාන්ත ගොඩනැගිලි | .. | 5 | – 50·0 | 5 | – |
| 4. පාසල් ගොඩනැගිලි | .. | 3 | — | 1 | – 66·7 |
| 5. එකතු කිරීම් සහ වෙනස් කිරීම් | .. | 382 | – 6·8 | 503 | 31·7 |
| 6. වෙනත් ගොඩනැගිලි | .. | 70 | – 29·3 | 50 | – 28·6 |
| මුළු ගණන | .. | 1,121 | 10·6 | 1,143 | 2·0 |

මූලය : කොළඹ මහ නගර සභාව.

(අ) රජයේ සහ සංස්ථාවල ගොඩනැගිලි සැලසුම් හැර.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවද නිවාස ඉදි කිරීම සඳහා සීමිත ණය ප්‍රමාණයක් ලබා දුනි. 1988 වර්ෂය තුළදී නිවාස ඉදි කිරීම් සඳහා මුදා හරින ලද මුළු ණය මුදල රුපියල් දශ ලක්ෂ 30 ක්ද, 1987 වර්ෂයේ මුළු ණය මුදල රුපියල් දශ ලක්ෂ 31 ක්ද විය. ණය මුදා හැරීමේ ප්‍රමාණය වැඩි නොවීමට බලපෑ ප්‍රධාන සාධකයක් වූයේ දිගුකාලීන අරමුදල් වැඩි කරගැනීමට සංස්ථාව අසමත් වීමයි. 1988 වර්ෂය තුළදී ණය සඳහා අය කළ පොලී අනුපාතික සියයට 9.5 සිට සියයට 22 දක්වා විය.

### නාගරික සංවර්ධනය

1988 වර්ෂය තුළදී නාගරික සංවර්ධන ව්‍යාපෘති හා අදාල කටයුතුවල පසුබැස්මක් දක්නට ලැබුණි. මෙයට බොහෝ දුරට බලපෑවේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් කරගෙන යනු ලැබූ විශාලතම පරිපාලන ව්‍යාපෘති, වාණිජ ව්‍යාපෘති සහ අනුග්‍රාහක ව්‍යාපෘති නිම කිරීමයි. වර්ෂය තුළදී නාගරික සංවර්ධන අධිකාරිය පරිසර සංවර්ධනය සහ රැකී රක්ෂා උත්පාදනය ආශ්‍රිත ව්‍යාපෘති කෙරෙහි විශාල අවධානයක් යොමු කරන ලදී. මෙයට අදාලව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙහෙයවන ලද ප්‍රධානතම ව්‍යාපෘතිය වන්නේ පෑලියගොඩ ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය යි. වර්ෂය තුළදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙහෙය වනු ලැබූ ප්‍රධානතම අනුග්‍රාහක ව්‍යාපෘති අතර අළුත්කඩේ ඉහළ උසාවි සංකීර්ණයත් ‘1988 ගම් උදාව’ ව්‍යාපෘතියත් වෙයි. 1988 වර්ෂය අවසානය වනවිට ඉහළ උසාවි සංකීර්ණයට අදාල ඉදි කිරීම්වලින් සියයට 70 ක් පමණ සම්පූර්ණ කර තිබුණි.

1988 වර්ෂයේ නාගරික සංවර්ධන කටයුතු සඳහා වැය වූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 510 කි. 1987 වර්ෂයේ මුළු වියදම වූ රුපියල් දශ ලක්ෂ 452 සමඟ මෙය සැසඳීමට පුළුවන. මුළු වියදමින් සියයට 60 කට ආසන්න ප්‍රමාණයක් අනුග්‍රාහක ව්‍යාපෘති වෙනුවෙන් වැය විය. කාර්මික සහ ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘති සඳහා තවත් රුපියල් දශ ලක්ෂ 45 ක් යොදවන ලදී. මේ අතර රුපියල් දශ ලක්ෂ 144 ක් ඉඩම් බැංකුව විසින් මෙහෙයවන ලද ව්‍යාපෘති සඳහා යෙදවිය.

### මහා මාර්ග සහ දුම්රිය මාර්ග

දිවයින තුළ නොකඩවා පැවති අභ්‍යන්තරික නොසන්සුන්තා මධ්‍යයේ වුවද, 1988 වර්ෂයේදී මහා මාර්ග පද්ධතිය කිලෝ මීටර් 309 කින් වැඩි කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය සමත් විය. එමෙන්ම කොළඹ–මහනුවර මහා මාර්ගයේ ප්‍රථම අදියර, කුරුණෑගල–මාදම්පේ, මීරිස්වත්ත–ගම්පහ සහ යක්කල–ගම්පහ යන මහා මාර්ගවල ප්‍රතිසංස්කරණ කටයුතු ලෝක බැංකු ආධාර යටතේ වර්ෂය තුළදී නිම කරනු ලැබීය. මෙයට අමතරව 1988 වර්ෂයේදී පාලම් 6 ක ප්‍රතිසංස්කරණ සහ නැවත ඉදි කිරීම් කටයුතුද සම්පූර්ණ කරන ලදී. මේ අතර 1987 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරන ලද මහා මාර්ග පද්ධතිය කිලෝ මීටර් 25,556 ක් වූ අතර, 1988 වර්ෂයේදී නඩත්තු කරන ලද ප්‍රමාණය කිලෝ මීටර් 25,865 ක් විය.

වර්ෂය තුළදී මහා මාර්ග ඉදි කිරීම සඳහා රුපියල් දශ ලක්ෂ 707 ක් වැය කරන ලදී. මෙය 1987 වර්ෂයේදී වැය කරන ලද මුදල වූ රුපියල් දශ ලක්ෂ 384 මෙන් දෙගුණයකට ආසන්න වැඩි වීමකි. මහා මාර්ග නඩත්තුව සඳහා වැය කරන ලද මුදල රුපියල් දශ ලක්ෂ 254 කි.

කිලෝ මීටර් 1,948 ක් වූ ඉකුත් වර්ෂයේ පැවති දුම්රිය මාර්ග පද්ධතිය 1988 වර්ෂයේදීත් නොවෙනස්ව පැවතුණි. කෙසේ වෙතත් දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම, පාලම් තැනීමේ වැඩ අංගනයෙහි දුම්රිය පාලම් නිෂ්පාදනය කිරීම සහ මරදාන–රාගම දක්වා තුන්වන දුම්රිය මාර්ගය ඉදි කිරීම වැනි කටයුතු වර්ෂය තුළදී සාර්ථක ලෙස ක්‍රියාත්මක විය.

### විදුලි පණිවුඩ හුවමාරු සේවා

පුළුල් ලෙස පැතිරුණ විශ්වාසදායී සේවයක් මහජනතාව වෙත ලබා දීම පිණිස 1988 වර්ෂය තුළදී විදුලි පණිවුඩ හුවමාරු අංශයෙහි කටයුතු තවදුරටත් වර්ධනය විය. විශේෂයෙන්ම අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල පුවරු ධාරිතාවය සහ හුවමාරු ධාරිතාවය සැළකිය යුතු අන්දමින් දියුණුවට පත් විය. මේ අතර පවත්නා විදුලි සංදේශ පද්ධතිය වැඩි දියුණු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම පිණිස මෙම වර්ෂය තුළදී පියවර කිහිපයක්ම ගනු ලැබීය.

මෙම වර්ෂය තුළදී ක්‍රියාත්මක වූ ව්‍යාපෘති අතර මහ කොළඹ ප්‍රදේශයේ විදුලි සංදේශ ව්‍යාපෘතිය, කොළඹ ප්‍රදේශයේ සංවර්ධන යෝජනා ක්‍රමයේ සිව් වැනි අදියර, හම්බන්තොට ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘතිය, ග්‍රාමීය හුවමාරු මධ්‍යස්ථානවලට ගුවන් විදුලි සම්බන්ධතා මගින් සන්ධි පරිපථ සැපයීම සහ සාමාන්‍ය විදුලි සංදේශ සේවා සංවර්ධනය ආදිය වේ.

1988 වර්ෂය අවසානය වනවිට මහ කොළඹ සංවර්ධන ව්‍යාපෘතියෙහි සිවිල් වැඩ කටයුතු වලින් සියයට 29 ක්ද, සංදාම සවි කිරීමේ කටයුතු වලින් සියයට 7 ක්ද, සම්ප්‍රේෂන කටයුතු වලින් සියයට 87 ක්ද සම්පූර්ණ කර තිබුණි. මේ අතර කොළඹ ප්‍රදේශයේ සංවර්ධන යෝජනා ක්‍රමයේ සිව්වැනි අදියරෙහි මුළු සවි කිරීම් වලින් සියයට 70 ක් පමණ සම්පූර්ණ කරන ලදී. මෙම ව්‍යාපෘතිය 1989 අප්‍රේල් මාසයේදී ආරම්භ කිරීමට අපේක්ෂිතය. පින්ලන්ත සංවර්ධන නියෝජ්‍යායතනය මගින් ආධාර ලබන හම්බන්තොට දිස්ත්‍රික්ක සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අගුණකොලපැලැස්ස, වලස්මුල්ල, වීරකැටිය, බෙලිඅත්ත, ඇඹිලිපිටිය සහ සෙවනගල හුවමාරු මධ්‍යස්ථානවලට අනුග්‍රාහක දුරස්ථ ඇමතුම් පහසුකම් ලැබුණි. මේ අතර මෙම ප්‍රදේශයේ පැරණි හුවමාරු මධ්‍යස්ථාන වෙනුවට නව අංකිත පහසුකම් සහිත හුවමාරු මධ්‍යස්ථාන පිහිටුවන ලදී.

මෙම විශේෂ ව්‍යාපෘති හැරුණුවිට 1988 වර්ෂය තුළදී දිවයිනේ සාමාන්‍ය විදුලි සංදේශ සේවා සංවර්ධනය කිරීමටද පියවර කිහිපයක්ම ගනු ලැබීය. 1988 වර්ෂයේදී අළුත් සෘජු දුරකථන මාර්ග 4,999 ක් ජාතික දුරකථන පද්ධතියට එක් වූ අතර ගල්කිස්ස ප්‍රදේශයේ දුරකථන පද්ධතියට පොලව යටින් දිවෙන යුගල සංදාම 3,280 ක් සවි කරන ලදී. මේ අතර 1987 වර්ෂයේදී 1,378 ක් වූ ටෙලෙක්ස් සම්බන්ධතා ගණන 1988 දී 1,516 දක්වා වැඩි විය.

මෙවැනි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වුවද, වර්ෂයේ අවසාන කාර්තුව තුළදී දිවයිනේ අභ්‍යන්තරික නොසන්සුන්තා සීඝ්‍ර ලෙස පැතිර යාමත් සමගම ඇතැම් පළාත්වල සේවාවන්ට බාධා පැමිණීම නිසා විදුලි සංදේශ සේවාවෙහි පසු බෑස්මක් දක්නට ලැබිණි. කළුතර, ගාල්ල, මාතර, මහනුවර, අනුරාධපුරය සහ කුරුණෑගල යන ප්‍රදේශවල විදුලි සංදේශ යන්ත්‍රවලට විශාල වශයෙන් අලාභහානි සිදු විය. මේ අතර කඹුරුපිටිය, දිගන, මඩොල්සිම සහ මතුරට දුරකථන හුවමාරු මධ්‍යස්ථානවල උපකරණවලටද අලාභහානි සිදු විය.

**කඩිනම් මහවැලි වැඩපිළිවෙල**

ප්‍රධාන යෝජනා ක්‍රම සහ ජලාශ ඉදි කිරීම් කටයුතු බොහොමයක් අවසන් වී තිබූ හෙයින්, 1988 දී කඩිනම් මහවැලි වැඩපිළිවෙල මගින් මූලික අවධානය යොමු කරන ලද්දේ කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි දියුණු කිරීම, පහළ ඇල සංවර්ධන කටයුතු, රැකියා අවස්ථා ඇති කිරීම සහ පවුල්වල ආදායම් තත්ත්වයන් ඉහළ නැංවීම සඳහායි. පහළ ඇල සංවර්ධන කටයුතුවල මූලික අරමුණ වූයේ ප්‍රධාන ජලාශ යෝජනා ක්‍රමවල ඉදි කිරීම් නිසා ඉඩම් අහිමිවූ පවුල් නැවත පදිංචි කිරීම් සහ ප්‍රධාන යෝජනා ක්‍රම යටතේ සංවර්ධනය වන ප්‍රදේශවල ගොවි පවුල් පදිංචි කිරීම සඳහා අවශ්‍ය ආර්ථික සහ සමාජ පොදු කාර්ය පහසුකම් වැඩි දියුණු කිරීමේ කටයුතු අඛණ්ඩව කරගෙන යාමයි. 1988 අවසානය වනවිට සියළුම ව්‍යාපෘතීන් සඳහා වැයවූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 46,279 ක් විය. එයින් රුපියල් දශ ලක්ෂ 3,191 ක් 1988 දී වැය කරන ලදී.

වර්ෂය තුළදී කඩිනම් මහවැලි වැඩපිළිවෙල යටතට එන ප්‍රධාන ජල විදුලිබල ව්‍යාපෘතීන්-වික්ටෝරියා (ගිගවොට් පැය 523), කොත්මලේ (ගිගවොට් පැය 438) සහ රන්දෙනිගල (ගිගවොට් පැය 213) මගින් ගිගවොට් පැය 1,174 ක විදුලිබල ප්‍රමාණයක් උත්පාදනය කෙරුණි.

**1 . 25 සංඛ්‍යා සටහන**

**කඩිනම් මහවැලි වැඩපිළිවෙල – ගණන් බලන ලද වියදම**

රුපියල් දශ ලක්ෂ

| යෝජනා ක්‍රමය | 1988 සඳහා වෙන් කළ වියදම | | | 1988 නියම වශයෙන් කළ වියදම (අ) | 1988 අවසන් වනවිට සමුච්චිත වියදම (අ) |
|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | පරිපූරක | එකතුව | | |
| 1. වික්ටෝරියා ජලාශය .. | 234 | — | 234 | 216 | 9,260 |
| 2. කොත්මලේ ජලාශය .. | 361 | — | 361 | 226 | 9,683 |
| 3. රන්දෙනිගල ජලාශය .. | 176 | — | 176 | 244 | 5,985 |
| 4. මාදුරුඔය ජලාශය සහ ඇල මාර්ගය .. | — | — | — | — | 2,645 |
| 5. මිනිපේ අන්තර් ද්‍රෝණි ඇල .. | — | — | — | — | 1,246 |
| 6. 'බී' වාරිමාර්ග කලාපය .. | 1,606 | — | 1,606 | 516 | 5,880 |
| 7. 'සී' වාරිමාර්ග කලාපය .. | 1,568 | — | 1,568 | 1,044 | 5,375 |
| 8. 'ජී' වාරිමාර්ග කලාපය .. | 82 | — | 82 | 66 | 460 |
| 9. 'එල්' වාරිමාර්ග කලාපය .. | — | — | — | 82 | 82 |
| 10. I වන අදියර .. | — | — | — | — | 529 |
| 11. II වන අදියර .. | 26 | — | 26 | 28 | 2,415 |
| 12. නඩත්තු කිරීම .. | 440 | — | 440 | 373 | 1,036 |
| 13. නාය යෑමෙන් විපතට පත් වූවන් නැවත පදිංචි කිරීම .. | 113 | — | 113 | 115 | 206 |
| 14. අනෙකුත් .. | 444 | — | 444 | 281 | 1,477 |
| එකතුව .. | 5,050 | — | 5,050 | 3,191 | 46,279 |

(අ) තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

## 1 . 26 සංඛ්‍යා සටහන

### මහවැලි සංවර්ධන වැඩපිළිවෙල යටතේ වගා කළ අළුත් ඉඩම් ප්‍රමාණය

හෙක්ටයාර

| ශීර්ෂය | | 1984/85 මහ | 1985 යල | 1985 එකතුව | 1985/86 මහ | 1986 යල | 1986 එකතුව | 1986/87 මහ | 1987 යල | 1987 එකතුව | 1987/88 මහ (අ) | 1988 යල (අ) | 1988 එකතුව(අ) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **'එච්' කලාපය** | .. | **23,309** | **18,319** | **41,628** | **24,298** | **21,225** | **45,523** | **24,965** | **13,058** | **38,023** | **24,847** | **14,307** | **39,154** |
| වී | .. | 22,957 | 9,709 | 32,666 | 23,449 | 8,983 | 32,432 | 23,317 | 5,933 | 29,250 | 23,560 | 5,428 | 28,988 |
| අනෙකුත් බෝග | .. | 352 | 8,610 | 8,962 | 849 | 12,242 | 13,091 | 1,648 | 7,125 | 8,773 | 1,287 | 8,879 | 10,166 |
| **'බී' කලාපය** | .. | **2,535** | **2,246** | **4,781** | **3,851** | **3,554** | **7,405** | **5,961** | **5,805** | **11,766** | **8,759** | **8,190** | **16,949** |
| වී | .. | 2,472 | 2,061 | 4,533 | 3,686 | 3,463 | 7,149 | 5,120 | 5,479 | 10,599 | 8,368 | 7,722 | 16,090 |
| අනෙකුත් බෝග | .. | 63 | 185 | 248 | 165 | 91 | 256 | 841 | 326 | 1,167 | 391 | 468 | 859 |
| **'සී' කලාපය** | .. | **7,545** | **4,857** | **12,402** | **9,358** | **7,868** | **17,226** | **10,139** | **9,588** | **19,727** | **14,164** | **4,154** | **18,318** |
| වී | .. | 6,086 | 4,827 | 10,913 | 7,945 | 7,782 | 15,727 | 9,057 | 9,480 | 18,537 | 12,420 | 4,090 | 16,510 |
| අනෙකුත් බෝග | .. | 1,459 | 30 | 1,489 | 1,413 | 86 | 1,499 | 1,082 | 108 | 1,190 | 1,744 | 64 | 1,808 |
| **'ජී' කලාපය** | .. | **3,258** | **2,106** | **5,364** | **3,315** | **2,731** | **6,046** | **3,279** | **2,709** | **5,988** | **4,507** | **3,109** | **7,616** |
| වී | .. | 2,941 | 1,198 | 4,139 | 3,153 | 1,423 | 4,576 | 3,220 | 1,176 | 4,396 | 4,094 | 1,236 | 5,330 |
| අනෙකුත් බෝග | .. | 317 | 908 | 1,225 | 162 | 1,308 | 1,470 | 59 | 1,533 | 1,592 | 413 | 1,873 | 2,286 |
| **එකතුව** | .. | **36,647** | **27,528** | **64,175** | **40,822** | **35,378** | **76,200** | **44,344** | **31,160** | **75,504** | **52,277** | **29,760** | **82,037** |

(අ) තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

වික්ටෝරියා ජලාශය අවට ප්‍රදේශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ නව මහා මාර්ගයක් ඉදි කිරීමේ බලපෑමට හසු වූ ගුරුදෙණියේ පැරණි කඩවීදිය වෙනුවට මහවැලි ගඟ දකුණු ඉවුරේ තවත් නව නගරයක් ඉදි කිරීමේ කටයුතු 1988 වර්ෂය තුළදී කරගෙන යන ලදී. වික්ටෝරියා ව්‍යාපෘතිය සඳහා 1988 වසර අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 9,260 ක් වැය කර තිබුණු අතර, මෙයින් රුපියල් දශ ලක්ෂ 216 ක් 1988 වසරේදී වැය කෙරුණි.

කොත්මලේ අවට ප්‍රදේශය සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙල යටතේ, නළ ජලය සැපයීමේ යෝජනා ක්‍රමයේද නව මහා මාර්ග කීපයක් සහ කොත්මලේ නව නගරයෙහි සමාජ පොදු කාර්ය පහසුකම් සැපයුම ආශ්‍රිත ඉදි කිරීම් කටයුතු ද ක්‍රියාත්මක වෙමින් පැවතිණි. මල්දෙණිය ආරෝග්‍යශාලාව වැඩි දියුණු කිරීම සහ සෞඛ්‍ය මධ්‍යස්ථාන තුනක ඉදි කිරීම් කටයුතු ද සම්පූර්ණ කෙරුණි. 1988 වර්ෂයේ අවසානය වනවිට කොත්මලේ ව්‍යාපෘතිය සඳහා රුපියල් දශ ලක්ෂ 9,683 ක් වැය කර තිබුණි. එම වියදමින් රුපියල් දශ ලක්ෂ 226 ක් 1988 දී වැය කරන ලදී.

රන්දෙනිගල ජලාශය අවට ප්‍රදේශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, පවතින මංමාවත් වැඩි දියුණු කිරීමේ කටයුතු මෙන්ම සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම පිළිබඳ ගවේෂණ කටයුතු සහ කීර්තිබණ්ඩාරපුර නව නගරයේ විදුලි බලය සැපයීමේ යෝජනා ක්‍රමයද වර්ෂය තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. 1988 වර්ෂයේ අවසානය වනවිට රන්දෙනිගල ව්‍යාපෘතිය සඳහා රුපියල් දශ ලක්ෂ 5,985 ක් වැය කර තිබුණු අතර, එම වියදමින් රුපියල් දශ ලක්ෂ 244 ක් 1988 දී වැය කරනලදී.

පහළ ඇල ප්‍රදේශ සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා පසුගිය වර්ෂයේ මෙන්ම සැළකිය යුතු වියදමක් දරනලදී. 'බී' සහ 'සී' කලාපවල වාරිමාර්ග යෝජනා ක්‍රම සංවර්ධනය සඳහා 1988 දී පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 516 ක් සහ රුපියල් දශ ලක්ෂ 1,044 ක් වැය කරන ලදී. මෙම යෝජනා ක්‍රම දෙක සඳහා 1988 අවසානය වනවිට කරන ලද මුළු වියදම පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 5,880 ක් සහ රුපියල් දශ ලක්ෂ 5,375 ක් විය.

තාවකාලික දත්තයන්ට අනුව, මහවැලි බල ප්‍රදේශය තුළ 1987/88 මහ කන්නයේදී හෙක්ටයාර 52,277 ක ප්‍රදේශයක් වගා කළ අතර, එය පසුගිය වසරේ අදාළ කන්නය සමඟ සසඳන කල සියයට 18 ක වර්ධනයක් පෙන්වයි. මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වාරිමාර්ග ජලය සැපයුම වැඩි වීම නිසා විශේෂයෙන්ම 'බී' සහ 'සී' කලාපවල වැඩි ඉඩම් ප්‍රමාණයක් වගාව යටතට ගෙනඒමට හැකි වීමයි. එයට වෙනස්ව යමින්, ප්‍රධාන වශයෙන් 'සී' කලාපයේ වගා කළ බිම් ප්‍රමාණය අඩු වීමේ ප්‍රතිඵලයක් වශයෙන්, 1988 යල කන්නයේදී මහවැලි බල ප්‍රදේශයේ වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 1,400 කින් හෙවත් සියයට 4 කින් අඩු වී හෙක්ටයාර 29,760 ක් විය.

1988 වගා වර්ෂය තුළදී, වගා කළ මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 82 ක පමණ වී වගා කර තිබිණි. මහ කන්නයේදී වගා කළ බිම් ප්‍රමාණයෙන් සියයට 93 ක් වී වගාව යටතේ වූ අතර, යල කන්නයේ දී එය සියයට 62 ක් විය. 1988 වගා වර්ෂය තුළදී 'බී' සහ 'සී' කලාපයන්හි වී වගාව යටතේ වූ බිම් ප්‍රමාණය පිළිවෙලින් සියයට 52 ක සහ සියයට 21 ක වැඩි වීමක් වාර්තා කළ අතර, 'ජී' සහ 'එච්' කලාපයන්හි වී වගා කළ බිම් ප්‍රමාණය පිළිවෙලින් සියයට 11 කින් සහ සියයට එකකින් පහත වැටුණි. 1988 වසරේ වෙනත් ක්ෂේත්‍ර බෝග යටතේ වූ බිම් ප්‍රමාණය සියයට 19 කින් වැඩි වී හෙක්ටයාර 15,119 ක් විය.

1988 වගා වර්ෂය තුළ මහවැලි බල ප්‍රදේශයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 266,479 ක් ලෙස ගණන් බලා ඇති අතර, එය රටේ මුළු වී නිෂ්පාදනයෙන් සියයට 11 කි. 'එච්' කලාපයේ පමණක් වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 103,870 ක් වූ අතර, එය මහවැලි ප්‍රදේශයේ වී නිෂ්පාදනයෙන් සියයට 39 ක් විය. කෙසේ වුවද, මෙය පසුගිය වසරේ වාර්තා වූ නිෂ්පාදනයට වඩා සියයට 11 ක අඩුවීමකි.

1988 වර්ෂයේ අවසානය දක්වා 'එච්' කලාපයේ පදිංචි කළ මුළු පවුල් සංඛ්‍යාව 28,866 කි. වර්ෂය තුළදී 'සී' කලාපයේ පවුල් 995 ක් පදිංචි කිරීමෙන්, 1988 වසර අවසානය වනවිට එම කලාපයේ පදිංචි කළ මුළු පවුල් සංඛ්‍යාව 14,821 දක්වා ඉහළ නැගුණි. 1988 අවසානය දක්වා 'බී' සහ 'ජී' කලාපයන්හි පිළිවෙලින් පවුල් 11,404 ක් සහ පවුල් 3,608 ක් පදිංචිකර තිබුණි.

**වෙනත් වාරිමාර්ග සංවර්ධනය**

ජලය සැපයීම සහ ජලාපවහන පහසුකම් වැඩි දියුණු කිරීම, කෘෂිකාර්මික නිෂ්පාදනය මෙන්ම භූමි ඵලදායිතාවය උපරිම කිරීම යන කරුණු කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය වාරිමාර්ග සංවර්ධනයයි. කඩිනම් මහවැලි වැඩපිළිවෙලට අයත් නොවන ප්‍රදේශයන්හි පවත්නා වාරිමාර්ග පුනරුත්ථාපනය කිරීම, වාරිමාර්ග සංවර්ධන වැඩපිළිවෙලෙහි ප්‍රධාන කාර්යයක් වුවද, දැනට පවතින වාරිමාර්ග ක්‍රම නවීකරණය කිරීම සහ නඩත්තු කටයුතු සඳහාත්, වාරිමාර්ග ක්‍රම මට්ටමින් සහ ගොවිපල මට්ටමින් වඩා සඵල ජල පාලන ක්‍රමයක් පවත්වාගෙන යාම පිණිසත්, වාරිමාර්ග සංවර්ධන වැඩපිළිවෙල මගින් වැඩි ප්‍රමුඛත්වයක් ලබා දුනි. ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි ක්‍රියාත්මක කරන ලද ඒකාබද්ධ කළමනාකරණ ක්‍රමයෙහි සාර්ථක බව අවබෝධ කර ගැනීම නිසා 1988 වර්ෂයේදී මෙම ක්‍රමය හෙක්ටයාර 1,012 (අක්කර 2,500) කට අඩු වාරිමාර්ග බල ප්‍රදේශයන්ටද ව්‍යාප්ත කරන ලදී. ඒකාබද්ධ කළමනාකරණ ක්‍රමය වාරිමාර්ග ක්‍රම කළමනාකරණයෙහි ගොවීන්ගේ සහභාගිත්වය වැඩි කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.

1988 වර්ෂයේ අවසාන මාස කිහිපය තුළ වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රදේශයන්හි අස්ථාවර තත්ත්වයන් වර්ධනය වීම නිසා වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි ඉදි කිරීම් සහ පුනරුත්ථාපන වැඩකටයුතුවල පසු බැසීමක් සිදු විය. 1988 වර්ෂයේ අවසාන කාර්තුවේදී පැවති අස්ථාවර තත්ත්වයන් නිසා වී වගාව සඳහා වෙන් කරන ලද ඉඩම් සකස් කිරීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවීමට සිදුවීමෙන් කිරිඳි ඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියේ පළමුවන අදියරෙහි වාරි මාර්ග සංවර්ධන කටයුතු අපේක්ෂිත පරිදි 1988 දී නිම කිරීමට නොහැකි විය. නොසන්සුන් තත්ත්වයන් නිසා පළමුවන අදියර යටතේ ජල සැපයුම් යෝජනා ක්‍රමයෙහි වැඩ කටයුතු 1988 නොවැම්බර් මාසයේදී තාවකාලිකව අත්හිටුවන ලදී. කිරිඳි ඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියෙහි පළමුවන පියවර යටතේ 1988 දී හෙක්ටයාර 600 කට වාරිමාර්ග පහසුකම් සපයනු ලැබීය. ව්‍යාපෘතියෙහි දෙවන පියවර යටතේ වාරිමාර්ග පහසුකම් සැපයිය හැකි හෙක්ටයාර 350 ක බිම් ප්‍රමාණයක් සංවර්ධනය කරන ලදී. කිරිඳි ඔය වාරිමාර්ග හා ජනාවාස ව්‍යාපෘතියෙහි පළමුවන සහ දෙවන පියවර යටතේ 1988 වසර තුළදී පවුල් 307 ක් පදිංචි කරවන ලදී. 1988 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියෙහි පළමුවන පියවර සඳහා වැය වූ මුළු පිරිවැය රුපියල් දශ ලක්ෂ 104 ක් වන අතර දෙවන පියවර සඳහා එය රුපියල් දශ ලක්ෂ 50 ක් විය.

1988 වසර තුළ අවසන් කිරීමට නියමිතව තිබූ නිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ යෝජනා ක්‍රමයෙහි දෙවන අදියරෙහි වැඩ කටයුතු සිවිල් කලබල නිසා වසර අගදී තාවකාලිකව අත්හිටුවීමට සිදු විය. මෙම ව්‍යාපෘතිය සඳහා 1987 වර්ෂයේ අවසානය වනවිට දරන ලද මුළු වියදම රුපියල් දශ ලක්ෂ 954 ක් වූ අතර, 1988 වර්ෂයේදී දැරූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 416 ක් වේ.

ග්‍රාමීය වාරිමාර්ග පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතේ 1988 වසර තුළදී යෝජනා ක්‍රම 63 ක කටයුතු නිම කෙරුණි. මෙම ව්‍යාපෘති සඳහා 1988 වසර අවසන් වනවිට දරන ලද මුළු වියදම රුපියල් දශ ලක්ෂ 228 ක් විය.

**ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල**

සමබර ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම සඳහා පුළුල් ලෙස සැලසුම් කිරීමේ වැදගත්කම අවබෝධ කර ගනිමින් මහා පරිමාණ යෝජනා ක්‍රමවලින් ප්‍රතිලාභ නොලබන ප්‍රදේශවල ඵලදායීතාවය, ජනතාවගේ ජීවන තත්ත්වය, ආදායම සහ සේවා නියුක්තිය වැඩි දියුණු කිරීම සඳහා ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය තවදුරටත් අවධානය යොමු කරන ලදී. 1988 දී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය දිස්ත්‍රික්ක 14 ක ක්‍රියාත්මක විය. අළුතින් කිසිම දිස්ත්‍රික්කයක් මෙම යෝජනා ක්‍රමය යටතට ගෙනඑනු නොලැබුවද, ජපන් රජයේ ආධාර ලැබීමට නියමිත ගම්පහ දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියෙහි මූලික වැඩ කටයුතු වර්ෂය තුළදී කරන ලදී.

**1 . 27 සංඛ්‍යා සටහන**

**ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල – දිස්ත්‍රික්ක අනුව වියදම**
**1987 – 1988**

රුපියල් දශ ලක්ෂ.

| දිස්ත්‍රික්කය (අ) | විදේශීය ආධාර ලැබෙන මූලාශ්‍ර | ගණන් බලන ලද වියදම | | | සමුච්චිත වියදම | | වියදම | |
|---|---|---|---|---|---|---|---|---|
| | | විදේශ ආධාර ප්‍රමාණය | දේශීය | එකතුව | 1987 වර්ෂය අවසානය දක්වා | 1988 වර්ෂය අවසානය දක්වා (ආ) | 1987 වර්ෂය තුළදී | 1988 වර්ෂය තුළදී (ආ) |
| 1. මාතර (1979) .. | සිඩා (ස්වීඩනය) | 338 | 37 | 375 | 152 | 174 | 34 | 22 |
| 2. හම්බන්තොට (1979) .. | නොරාඩ් (නෝර්වේ) | 686 | 14 | 700 | 382 | 450 | 72 | 68 |
| 3. නුවරඑළිය (1980) .. | නෙදර්ලන්තය | 510 | 10 | 520 | 245 | 287 | 41 | 42 |
| 4. මාතලේ (1981) .. | ලෝක බැංකුව | 307 | 145 | 452 | 278 | 302 | 33 | 24 |
| 5. පුත්තලම (1981) .. | ලෝක බැංකුව | 397 | 187 | 584 | 427 | 467 | 49 | 40 |
| 6. බදුල්ල (1982) .. | කෘෂි. සං. ජා. අරමුදල | 500 | 110 | 610 | 254 | 277 | 56 | 23 |
| 7. වවුනියාව (1984) .. | ලෝක බැංකුව | 246 | 133 | 379 | 63·6 | 63·7 | 1 | 0·1 |
| 8. මන්නාරම (1984) .. | ලෝක බැංකුව | 220 | 118 | 338 | 55·3 | 55·4 | 1·3 | 0·1 |
| 9. රත්නපුරය (1984) .. | නෙදර්ලන්තය | 209 | 4 | 214 | 81 | 107 | 29 | 26 |
| 10. මොණරාගල (1984) .. | නොරාඩ් (නෝර්වේ) | 392 | 8 | 400 | 102 | 148 | 55 | 46 |
| 11. මුලතිව් (1985) .. | නෙදර්ලන්තය | 90 | 2 | 92 | 5·3 | 5·4 | 1·3 | 0·1 |
| 12. කෑගල්ල (1986) .. | කෘෂි. සං. ජා. අරමුදල | 262 | 147 | 409 | 35 | 72·3 | 25 | 37·3 |
| 13. කළුතර (1987) .. | ෆිනිඩා (ෆින්ලන්තය) | 224 | 38 | 262 | 7 | 64 | 7 | 57 |
| 14. මහනුවර (1987) .. | ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව | 32 | — | 32 | 0·2 | 1·7 | 0·2 | 1·5 |

(අ) ක්‍රියාත්මක කරන ලද වර්ෂයන් වරහන් තුල දක්වේ.
(ආ) තාවකාලික.

මූලය : සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය.

1987 වර්ෂයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය සඳහා දරන ලද මුළු වියදම වූ රුපියල් දශ ලක්ෂ 405 සමඟ සසඳන කල 1988 මුළු වියදම රුපියල් දශ ලක්ෂ 387 ක් විය. 1988 වර්ෂයේ අවසානය දක්වා සියළුම ව්‍යාපෘති වෙනුවෙන් කරන ලද මුළු වියදමද සමග 1987 සහ 1988 වර්ෂවල දරන ලද වියදම් 1.27 වන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

සිවිල් කලබල තවදුරටත් පැවතීම නිසා 1988 වර්ෂයේදී ද මන්නාරම, වවුනියා හා මුලතිව් යන දිස්ත්‍රික්කයන්හි ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම තවදුරටත් තාවකාලිකව අත්හිටුවා තිබිණ. වර්ෂය අගදී පැවති නොසන්සුන් තත්ත්වය නිසා අනෙකුත් ව්‍යාපෘතීන්ද විශේෂයෙන්ම මොණරාගල, මාතර සහ බදුල්ල යන දිස්ත්‍රික්කවල ව්‍යාපෘතීන් පසු බෑස්මකට ලක් විය.